# 7 විවිධාර්ථවත් පද

ජීව භාෂාවක් යනු නිරන්තර අලුත් පද, අර්ථ එකතු වෙමින් නවීකරණය වන්නකි. එවන් බසක පද (වචන) ඒකීය අර්ථ ප්‍රකාශනවලට සීමා නොවී විවිධාර්ථ පළ කිරීම පිණිස යෙදේ. එක පදයකට අර්ථයෙන් සමාන ව යෙදෙන පද ගණනාවකි. විටෙක එක පදයකට අර්ථ ගණනාවකි. ඇතැම් තැනක එක් පදයකට යෙදෙන විරුද්ධාර්ථ පදයකි. මෙසේ භාෂා ව්‍යවහාරයේ දී නොයෙක් නොයෙක් අර්ථ සහිත ව යෙදෙන පද විවිධාර්ථවත් පද ලෙස හඳුන්වමු. බස හැසිරවීමට එබඳු විවිධාර්ථවත් පද ගැන දැන ගැනීම අත්‍යවශ්‍ය වේ.

**විවිධාර්ථවත් පද**

| සමානාර්ථ පද | බහ්වර්ථ පද | විරුද්ධාර්ථ පද |
|---|---|---|
| එක ම අර්ථය පැවසීම සඳහා යෙදෙන පද ගණනාවක් ඇති වචනය. | එක පදයකට අර්ථ කීපයක් ලබා දෙන (බොහෝ අර්ථ ඇති) වචනය. | කිසියම් පදයකට විරුද්ධ වූ අර්ථයක් දෙන වචනය. |

**සමානාර්ථ පද**

නිදසුන් :

හිරු = සූර්යයා<br>
දිනපති<br>
දිනිසුරු<br>
දිවාකර<br>
දිනමිණ<br>
සහසකර

**බහ්වර්ථ පද**

ගුරු<br>
ගුරු පුද<br>
ගුරු ග්‍රහයා<br>
ගුරු - ලසු භේදය<br>
ගුරු පාර ළඟ

* මෙහි ගුරු යන පදය බහු අර්ථවල යෙදේ.

**විරුද්ධාර්ථ පද**

මඟුල් - අවමඟුල්<br>
අගාරික - අනගාරික<br>
අර්ථය - අනර්ථය<br>
උසස් - පහත්<br>
දිවා - රාත්‍රි

**කියවන්න**

හිමි සනරාමර ලෝක සිවංකර<br>
ලොව්තුරු බුදු සමිඳේ<br>
මා හද මැලවෙන මල් දෝතට ගෙන<br>
පාද වඳිමි නිබඳේ

හිමි ගුණ ආකර ලෝක දිවාකර<br>
ලොව්තුරු බුදු සමිඳේ<br>
හිත දුක වාවන බුදු බණ පදයක<br>
මිහිර දකිමි නිබඳේ

හිමි දම් ආකර ගුණ මිණි සාගර<br>
ලොව්තුරු බුදු සමිඳේ<br>
හිත සුවදයක බුදු ගුණ ගීයක<br>
මිහිර විඳිමි නිබඳේ

**ගී සංකල්පනා - රඹුකන සිද්ධාර්ථ හිමි**



බුදුන් වහන්සේ යන යෙදුමට මෙම ගී සංකල්පනාවේ සමානාර්ථවත් පද රැසක් යොදා ඇත.

| | |
|---|---|
| හිමි සනරාමර<br>ලෝක සිවංකර<br>ගුණ ආකර<br>ලෝක දිවාකර<br>දම් ආකර<br>ගුණමිණි සාගර | බුදුරජාණන් වහන්සේ |

භාෂාවේ පද සඳහා විවිධ සමානාර්ථවත් පද යෙදිය හැකි ය. පද්‍ය හෝ ගද්‍ය ප්‍රකාශනයක එසේ යෙදූ විට එහි අර්ථය අලංකාරත්වයට පත් වේ.

### 7.1 ක්‍රියාකාරකම


i. "අ" තීරයෙහි දැක්වෙන පදවලට සමානාර්ථවත් පද දෙක බැගින් "ආ" තීරයෙන් තෝරා ලියන්න.

| අ | ආ | |
|---|---|---|
| පන්සල | විහඟ, | තරිඳු , |
| කාන්තාව | අරම, | නිරිඳු, |
| කුරුළු | මුදුන, | සර, |
| රජ | නද | සොමි, |
| හඬ | භූපති, | විදුහල, |
| හිස | මග, | සයුර, |
| පාසල | මාවත, | සිප්හල, |
| පාර | රත්නාකරය, | මස්තකය, |
| සඳ | සියොත්, | ආරාමය, |
| මුහුද | මාගම, | ස්ත්‍රිය |

i. ඉහත සඳහන් වචනවලින් කැමති වචන දහයක් යොදා අර්ථවත් වාක්‍ය දහයක් ගොඩනගන්න.

## 7.2 ක්‍රියාකාරකම

i. කුඩා වෘත්තයේ එන පදවලට ගැළපෙන - බහ්වර්ථ පද තුන බැගින් ලොකු වෘත්තයෙන් තෝරා වගුවක යොදන්න




ii. පහත සඳහන් කවියේ තද කළු අකුරු සහිත පද වෙනත් අර්ථ මතුවන සේ යොදා වාක්‍ය 05ක් ගොඩනගන්න

| | |
|---|---|
| **සත්** ගුණ යුත් සතන් හට වැඩ කළොත් | සරු |
| අත් පිට දියුණුව ම **පල** දේ ය | නිරතුරු |
| වත් කළ **දිය** නෙරළු **තුරු** මුලට | පියකරු |
| දෙත් මුදුනෙන් පල **රැස** රැගෙන | අමයුරු |

### 7.3 ක්‍රියාකාරකම

i. "අ" වෘත්තයේ ඇති පදවලට විරුද්ධාර්ථවත් පද "ආ" වෘත්තයෙන් තෝරා ලියන්න.

| අ | ආ |
|---|---|
| උදය, දකුණ, උසස්, යුක්තිය, උඩ, බටහිර, ලාභය, බාහිර, පව්, දිවා, නින්ද, සහනය, ජය, ගුණ, අර්ථය, ආරම්භය, අගාරික | පරාජය, රාත්‍රි, අගුණ, නැගෙනහිර, අනර්ථය, යට, අභ්‍යන්තර, උතුර, පින්, අවසානය, අයුක්තිය, පහත්, ප්‍රශංසා, අලාභය, අනගාරික, අසහනය, සවස |

ii. "අ" තීරයේ ඇති වචනවලට අදාළ විරුද්ධාර්ථ පදය "ආ" තීරයෙන් තෝරා යා කරන්න.

| අ | ආ |
|---|---|
| 1. භය | යස |
| 2. උත්තීර්ණ | යටිකුරු |
| 3. දියුණු | නිර්භය |
| 4. අයස | අවතීර්ණ |
| 5. කුටිල | නොදියුණු |
| 6. උඩුකුරු | අකුටිල |